# පරිසරය හා සෞඛ්‍යය

මහාචාර්ය කාලෝ ෆොන්සේකා

ලෙඩක් තිබෙන ඕනෑම කෙනෙකුට විසඳගත යුතු කිසියම් සෞඛ්‍ය ප්‍රශ්නයක් තිබේ. තම වෘත්තීය අනුව දොස්තරවරයෙකු ගේ යුතුකම ලෙඩවූ තැනැත්තා ගේ ප්‍රශ්නය විසඳීමයි. තමා ගේ යුතුකම ඉටු කිරීමට දොස්තර ලෙඩාට තිබෙන දුර්වලකම හඳුනා ගත යුතුය. එය හඳුනා ගෙන ඊට හේතුව සෙවිය යුතුය. එනම් ඊට හේතුනාවය සේවීමයි.

මේ සියවසේ වැඩි කාලයක්, ජීව වෛද්‍ය විද්‍යාවේ බලපෑම මත, දොස්තරවරු බොහෝසෙයින් ශරීරයේ පවතින රෝග නිධාන අනුව ලෙඩෙකු ගේ දුර්වලකම්වලට හේතු විස්තර කිරීමට උත්සාහ කළහ. කෙසේ වෙතත් මෑතදී සෞඛ්‍ය ගැටළු විසඳීමට සාමූහික තත්ත්වය කෙරෙහි අවධානය යොමු කිරීමේ වැදගත්කම දොස්තරවරුනට වැටහී තිබේ. මෙහි එක් අංශයක් නම් ලෙඩුන් ගේ දුර්වලකම් තේරුම්ගැනීමටත් තේරුම් කිරීමටත් ඔවුන් ගේ භෞතික සහ සමාජ-සංස්කෘතික පරිසරය කෙරෙහි අවධානය යොමු කිරීමයි. මනා පුහුණුවක් තිබෙන, නියමිත පරිදි විද්‍යාත්මක වෛද්‍යකර්මය ක්‍රියාත්මක කරන දොස්තරවරු අද දින සෑම ලෙඩෙකු පිළිබඳව ම කිසියම් ප්‍රශ්නයකට පිළිතුරක් සොයති. ඒ ප්‍රශ්නය මෙයයි. ඔහු ගේ පරිසරය අනුව ලෙඩාට තිබෙන දුර්වලකම කෙසේ තේරුම් කළ හැකි ද යන්නයි. මේ ප්‍රශ්නයේ ගැබ්වී තිබෙන අදහස නම් පරිසරය සහ සෞඛ්‍යය බැඳී පවතින බවයි. එහෙයින් මිනිස් සෞඛ්‍ය වර්ධනයට නම් පරිසර රක්ෂණය අවශ්‍යය. "මෙන්ස් සානා ඉන් කෝපරේ සානා" යන පැරණි ලතින් කියමනේ නව මුහුණුවර, "නිරෝගී ගතකට නිරෝගී පරිසරයක්" යනුයි. නවීන මිනිසා ගේ ආගම පරිසරදහම විය යුතුය. පරිසරදහම අදහන්නෝ වාසනාවන්තයෝය. මානව සංහතිය නිරා දුකින් මුදගත්තෝත් මහ පොළව විනාශයෙන් රැකගත්තෝත් ඔවුහුය

ආර්ථික වර්ධනය ම පරමාර්ථයකොට ගැනීම නිසා එහි විපාකයක් ලෙස පොළවේ පස, ජලය සහ වාතය දූෂණය වූ බව නිගමනය කළ හැකිය. රටවල්වල දළ ජාතික නිෂ්පාදිතය ඉහළ යත්ම පරිසර දූෂණය වර්ධනය විය. ඇතැම් පරිසරධර්මවාදීන් පවසන පරිදි දළ ජාතික නිශ්පාදිතය පිළිබිඹු කරන්නේ දළ ජාතික පරිසර දූෂණයයි. එය කෙසේ වෙතත් බොහෝ රටවල රජයයන් වටහා ගෙන තිබෙන පරිදි ප්‍රබල ආර්ථිකයක ප්‍රතිඵලය දූෂිත, දුබල පරිසරයකි. අද මානව සංහතියට මුහුණ දීමට තිබෙන තීරණාත්මක ප්‍රශ්නය දිගටම පවත්වා ගෙන යන ආර්ථික වර්ධනය සෞඛ්‍ය සම්පන්න පරිසරයකට නො ගැළපෙන්නේ ද යන්නයි.

රටවල් කීපයෙක වෙළෙඳ ව්‍යාපාරිකයන් විපත්තිදයක විමෝචනය, නාස්තිය වැළැක්වීම, බලශක්තිය සහ සම්පත් සුරැකීමෙන් පාරිසරික දූෂණය අඩුවීම පමණක් නොව තමන් ගේ ලාබ වැඩිවන බව ද අවබෝධ කැර ගත්තේ මෑතක දීය. එහෙයින් න්‍යායානුකූලව, ප්‍රබල ආර්ථිකයක් සෞඛ්‍ය සම්පන්න පරිසරයකට, නො ගැළපේ යැයි නිගමනය කළ නො හැකිය. දෙක එකිනෙකට සම්බන්ධ ව පැවැතිය යුතුය. එය එසේ ම විය යුතුය. සංවර්ධන ක්‍රියාවලියේ දී එය එසේ සිදු නොවුව හොත් ලෝක තත්ත්වයෙන් බලන විට පාරිසරික බලපෑමෙන් ම සිදු වන මානව සංහාරය අනාගතය පිළිබඳ න්‍යායික සිතිවිල්ලක් ම නො වේ, සිදු විය හැකි යැයි නිගමනය කළ හැකි අති භයානක සිද්ධියකි. ඇතැම් තක්සේරු අනුව දැන් පවතින ඕසෝන පිරිහීම නොකඩවා සිදු වුවහොත් ඉදිරි වසර 200 තුළ මිනිස් සංහතියේ අවසානය ළඟා වනු ඇත.

මින් පෙර නො සිදු වූ අන්දමින් පරිසර දූෂණයෙන් ජනතාවට හානි පැමිණෙන බව සත්‍යයකි. ලොවේ වන විනාශය, පස් සෝදා පාළුව, ගස් සහ සත්ව වර්ග ශූන්‍ය වීම, පිළිකා හටගන්වන හිරු විහිදුවන පාරජම්බුල විකිරණයෙන් මිනිසා ආරක්ෂා කරන ඕසෝන් තට්ටුව පළුදු වීමෙන්, පොළෝ මතු පිට උෂ්ණත්වය අධික වීම, ඇසිඩ් වැසි, න්‍යෂ්ටික සුන්බුන් අවකාශයට ඇතුල් වීම ආදියෙන් මිනිස් වාසයට මේ ග්‍රහ ලෝකය නුසුදුසු බවට පත් වේ. මෙම උපද්‍රවය සත්‍යයකි. එහෙත් පොළොව මත වාසය කරන මිනිසාගෙන් විශාල කොටසකට මෙය වටහා ගැනීමට තරම් විද්‍යාත්මක දැනුමක් නොමැත. කොයි මොහොතේ හෝ විය හැකි මේ භූමි භංගයේ භයානක කම ඔවුනට නො වැටහේ. මීට හේතු එක් රටකට සීමා වූවක් නො වේ, මුළු ලොවටම සාධාරණය. එම නිසා මුළු ලොව ම එක් වී මෙය වැළැක්වීමේ පියවර ගත යුතුය.

දැනට මිනිස් සංහතියට ජීවිත නාශක තර්ජනයක් එල්ල කරන පරිසර පරිවර්තනයට මුල් වූ හේතු මූලික සහ විශාල වශයෙන් හටගත්තේ ධනවත් කාර්මික රටවලය. එහෙත් මෙම කටයුතුවල දැනට නො පෙනෙන භයානක ප්‍රතිඵල වර්තමාණයේත් අනාගතයේත් දැඩි ලෙස බුක්ති විඳින්නට සිදුවන්නේ පොහොසත් රටවලට වඩා දුප්පත් රටවල ජනතාවටය. මානව සංහතිය විඳින මෙම දුශ්කරතාවයට ධනවත් රටවලට දොස් කීමෙන් එය ඉවත් නො වේ. එම නිසා ශ්‍රී ලංකාවේ වාසය කරන අප මේ දුශ්කරතාව පිළිබඳ ව මේ මොහොතේ කුමක් කළ යුතුද? මේ මහ පොළොව දූෂණය කිරීමට අපටත් තිබෙන අයිතිවාසිකම ගැන තදින් කියා සිටීම ද යුතුකම? එය මුහුණට නිගා කිරීමට නහය කැපීම වැනි වැඩකි. පරිසර අපකර්ෂණ ක්‍රියාවලිය කවුරු ආරම්භ කළත්, එය වර්ධනයට කටයුතු නො කිරීම අප කාගේත් යහපත පිණිස වන්නේය. එය වළක්වා ඉන් වූ හානිය මඟ හැරවීම අප කාගේත් යුතුකමයි. මේ ගැන තර්කයක් නැත. පොළොතලයේ උෂ්ණය වැඩි වීමෙන් සාගර ජල මට්ටම ඉහළ නගින විට, ඉන්දියන් සාගරයේ ජල මට්ටම ඉහළ නඟින්මැයි. එය අප ගේ දරු මුණුපුරන් ගේ හිස්වලට ඉහළින් නැඟීම නො වැළැක්විය හැකිය. එය අපේ සෞඛ්‍යයට ගුණ නැත.